# ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
# பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
# OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ம்மாடி "ஆ" ஹரிச்சந்திரா மாவத்த, அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரனை / Inquries: 025-2235790
Fax: 025-2224914
E-mail csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/17/3/I
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.02. 06


ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 03/2024 (I)

උතුරු මැද පළාතේ

සියළුම ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් වෙත .

<u>පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට එරෙහිව පවතින විනය කටයුතු.</u>

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට එරෙහිව පවත්වන විනය කටයුතු ප්‍රමාදයකින් තොරව කඩිනමින් පවත්වා අවසන් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් 2024- 05-22 දින සිට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 මගින් පහත දැක්වෙන පරිදි විනය බලතල පවරා ඇත.

| නිලධාරි ගණය | විනය බලධරයා |
|---|---|
| • අධ්‍යාපන පරිපාලන සේවය<br>• දිවයින්ව්‍යාප්ත සේවයට අයත් නොවන විධායක ශ්‍රේණිවලට අයත් තනතුරු<br>• විදුහල්පති සේවය<br>• තෘතියික මට්ටමේ සියළුම තනතුරු ( මාණ්ඩලික ශ්‍රේණි) | ප්‍රධාන ලේකම් |
| • ද්විතියික මට්ටමේ සියළුම ශ්‍රේණි | ප්‍රධාන ලේකම් / සියළුම ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු , |
| • ශ්‍රී ලංකා ගුරු සේවය | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| • ප්‍රාථමික මට්ටමේ සියළුම ශ්‍රේණි | අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා |

02. එසේම මූලික විමර්ශන පැවැත්වීමේදී සිදුවන අපහසුතාවයන් හා ප්‍රමාදයන් මෙන්ම නෛතික ගැටළු හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් හා නීතිමය බාධක ඉවත් කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා විනය කාර්ය සංග්‍රහය (2020) අවලංගු කර , ඒ වෙනුවට විනය කටයුතු සඳහා ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩය අදාල කර ගැනීමට 2021-05-10 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

03. මේ අනුව යම් සිද්ධියක් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්විය යුත්තේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන පරිදිය. එමගින් යම් විෂමාචාරයක් සිදු වී ඇති බව අනාවරණය වූ වහාම ඒ පිළිබඳ සුදුසු නිලධාරියෙකු හෝ කමිටුවක් පත්කර මූලික විමර්ශනයක් පැවැත්වීමට අදාල විනය බලධරයාට හෝ ආයතන ප්‍රධානියාට හෝ වෙනත් බලධරයෙකුට බලය ඇත. ඒ අනුව මූලික විමර්ශනය පැවැත්වීම සඳහා තම අමාත්‍යාංශය , දෙපාර්තමේන්තුව හෝ කාර්යාල යටතේ සේවය කරන සුදුසු නිලධාරියෙකු පත් කිරීමට අදාල අමාත්‍යාංශ ලේකම්ට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියාට එමගින් බලය පැවරී ඇත .


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පුහුණු / பயிற்சி / Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planing | ඉංජිනේරු / பொறியியல் / Engineering | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|---|
| දුරකථනය / தொ.பே.இல / Telephone | 025-2224915 | 025-2228232 | 025-2237430 | 025-2222238 | 025-2220910 | 025-2222736 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 025-2222736 | 025-2220950 | 025-2237430 | 025-2225295 | 025-2235787 | 025-2222736 |
| විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail | ocsncpc@gmail.com | ncpmdtu@gmail.com | treasuryncp@gmail.com | dept.planning.ncp@gmail.com | ncpengineering@yahoo.com | ocsncpc@gmail.com |

04. විනය බලතල මධ්‍යගතව තිබීම හේතුවෙන් ඇතිවන ප්‍රමාදයන් මගහරවා ගැනීම පිණිස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ඇතිව මෙලෙස විනය බලතල දෙපාර්තමේන්තු ප්‍රධානීන් දක්වා මට්ටම් කිහිපයක් වෙත පවරා තිබුනද තවදුරටත් , එම කටයුතුවල ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය වන අතර , මෙම ප්‍රමාදයන් සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ දැඩි අවධානයද යොමු වී ඇත.

05. රජයේ නිලධාරීන්ට එරෙහිව විනය කටයුතු පැවැත්වීමට අදාල ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම මෙම ප්‍රමාදයන් හා ඇති වී ඇති ගැටළුකාරී තත්වයන්ට හේතුවී ඇති බව නිරීක්ෂණය වන අතර , මෙම ගැටළු මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් මඟ පෙන්වීම හා නිලධාරීන් සිය රාජකාරි වගකීම නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධයෙන් , ගතයුතු ක්‍රියාමාර්ග පිලිබඳ පහත සඳහන් අභ්‍යාන්තර චක්‍රලේඛ මඟින් මවිසින් සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.

| චක්‍රලේඛ අංකය හා දිනය | චක්‍රලේඛ |
|---|---|
| ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 2021/01<br>2021-11-05 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට එරෙහිව පවත්නා විනය කටයුතු සම්බන්ධයෙන් වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම |
| ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 2023/04<br>2023-07-26 | උතුරු මැද පළාත් සභාවේ ආයතන හා දෙපාර්තමේන්තුවලට එරෙහිව පවතින අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීති අංශයෙන් සහය ලබා ගැනීම |
| ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 03/2024<br>2024-03-25 | පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට එරෙහිව පවත්වන විනය කටයුතු කඩිනම් කිරීම |

06. මෙයට අමතරව පසුගිය වර්ෂවල විනය කටයුතු හා මූලික විමර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු මාලාවක් පවත්වා නිලධාරීන් පුහුණු කර ඇත. මෙම පුහුණු වැඩසටහන්වලදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන අධ්‍යක්ෂකවරයා ගෙන්වා ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක්ද පවත්වා ඇත.

07. එබැවින් විනය කටයුතු හා මූලික විමර්ශන පැවැත්වීම සඳහා දැනුම හා පුහුණුව ඇති නිලධාරීන් අවශ්‍ය තරම් සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවක සිටී. එසේ වුවද බොහෝවිට මෙම ප්‍රමාදයට හේතු වී ඇත්තේ මූලික විමර්ශන සඳහා තමා යටතේ සේවය කරන නිලධාරීන් පත් නොකර වෙනත් අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් පත් කිරීම බව නිරීක්ෂණය වී ඇත. එබැවින් මෙම ප්‍රමාදයන් සිදුවීම , මූලික විමර්ශන පැවැත්වීම සඳහා පත්කරන නිලධාරීන්ගේ දෝශයක් නිසා නොව අදාල විනය බලධරයා හා ආයතන ප්‍රධානීන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන හා ඉහත සඳහන් අභ්‍යාන්තර චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස් හා මඟපෙන්වීම් අනුව තම රාජකාරි වගකීම නිසි පරිදි ඉටු නොකිරීමයි.

08. එබැවින් තවදුරටත් මෙවැනි තත්වයක් පැවතීම යහපත් රාජ්‍ය සේවයක් සඳහා සුදුසු නොවන බැවින් , ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන හා ඉහත චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස් තරයේ අනුගමනය කරමින් මූලික විමර්ශන සම්බන්ධයෙන් වන ප්‍රමාදයන් මඟ හරවා ගැනීම සඳහා පහතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

I. සෑම අමාත්‍යාංශයක්ම තම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවලට අදාල මූලික විමර්ශන පැවැත්වීම සඳහා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / සහකාර ලේකම් හෝ පරිපාලන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් මූලික විමර්ශන ඒකකයක් පිහිටුවා එම ඒකකයට අමාත්‍යාංශ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු , කාර්යාලවල සේවය කරන සුදුසු නිලධාරින් පත්කර එම නිලධාරින් මඟින් මූලික විමර්ශන පැවැත්වීම

II. විශේෂඥ දැනුම ඇති නිලධාරින් නොමැති අවස්ථාවකදී හැර අන් සෑම අවස්ථාවකම මූලික විමර්ශන සඳහා තම අමාත්‍යාංශ යටතේ ඇති ආයතනවල සේවය කරන නිලධාරින් පත්කර මූලික විමර්ශන පැවැත්වීම

III. ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 03/2024 හි V හි ඡේදයේ පරිදි අදාල පත්වීම් ලිපියෙහි විමර්ශන කටයුතු සඳහා ලබාදෙන කාලසීමාව නිශ්චිතව සඳහන් කල යුතු අතර සාධාරණ හේතුවක් නොමැති නම් එකී කාලසීමාවන් දීර්ඝ නොකිරීම.

IV. ඉහත III හි සඳහන් කාලසීමාව තුල විමර්ශන අවසන් කිරීමට අපොහොසත් වන නිලධාරින් සම්බන්ධයෙන් මාගේ ඉහත චක්‍රලේඛයෙහි (03/2024) XI හි සඳහන් උපදෙස් පරිදි අදාල නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ ,
ප්‍රධාන ලේකම් ,
උතුරු මැද පළාත.

පිටපත -

01. ආණ්ඩුකාරවර ලේකම් , ආණ්ඩුකාර කාර්යාලය , උ.මැ.ප. - ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා